00011

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා)උපාධි වැඩසටහන-පස්වන මට්ටම 2018/2019

අවසාන පරීක්ෂණය - 2019

නාට්‍ය හා රංගකලාව ඉගැන්වීම සඳහා අධ්‍යාපන තාක්ෂණය - STU5827/ESU3327

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2019.02.17 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

<u>1 වන කොටස</u>

01. වර්තමානයේ දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා බහුමාධ්‍ය යොදා ගැනීම බහුල වී ඇත. 'බහුමාධ්‍ය' යන්න පැහැදිලි කොට, නාට්‍ය හා රංග කලාව විෂය ඉගැන්වීමේ දී බහුමාධ්‍ය භාවිත කරන අවස්ථා උදාහරණ දෙකක් (02) ඇසුරින් දක්වන්න.

02. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තාක්ෂණය සමෝධානයෙන් වැඩිදියුණු කළ හැකි සන්නිවේදන ක්‍රියාවලියකි. සන්නිවේදන මූලධර්ම ඇසුරින් පැහැදිලි කරන්න.

03. නාට්‍ය හා රංගකලා විෂයේ දී, ශ්‍රව්‍ය දෘෂ්‍ය ආධාරක භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් (02) උදාහරණ ඇසුරින් දක්වන්න.

04. ගැටලු විසඳීමේ දී භාවිත කරන න්‍යායාත්මක පදනම දෙවැදෑරුම් වේ. එම ක්‍රම දෙක (02) නම්කොට කෙටියෙන් විස්තර කරන්න.

05. ගැටලුවක් විසඳීමේ අරමුණු ඇතිව සකස් වූ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ දී අනුගමනය කළයුතු පියවර පහ (05) නම් කරන්න.

06. කතන්දර කීම ප්‍රමුඛ පෙළේ ඉගැන්වීමේ ශිල්පීය ක්‍රමයකි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී නාට්‍ය හා රංගකලා ගුරුවරයෙක් ලෙස කතන්දර කීම යොදා ගැනීමේ දී සැලකිලිමත් වියයුතු කරුණු පහක් (05) දක්වන්න.

07. 'සමාකරණය' ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යොදා ගන්නා ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීම් ක්‍රමයකි.

(i) 'සමාකරණය' පැහැදිලි කොට නාට්‍ය හා රංග කලා විෂයේ දී එය භාවිත වන අවස්ථා තුනක් (03) දක්වන්න.

(ii) ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සමාකරණය යොදා ගැනීමේ වාසි දෙකක් (02) නම් කරන්න.

08. ඉගෙනුමක් යනු චර්යාවේ දිගුකාලීනව සිදුවන වෙනසකි. බෙන්ජමින් බ්ලූම් ප්‍රධාන මනෝ විද්‍යාඥයන් ඉදිරිපත් කළ පුද්ගල චර්යාවේ සිදුවන මෙම වෙනස පිළිබඳව ඒ ඒ ක්ෂේත්‍ර ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 05 x 8 = 40)

## 2 වන කොටස.

09. (i) ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පන්ති කාමරය තුළ නාට්‍ය අත්දැකීම් යොදා ගැනීමෙන් ශිෂ්‍යයාගේ පෞරුෂය සංවර්ධනය වන ආකාරය අංශ පහක් (05) ඔස්සේ පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) නාට්‍ය හා රංගකලා ගුරුවරයෙක් ලෙස ශිෂ්‍යයන්ගේ නිර්මාණාත්මක චින්තනය සංවර්ධනය කිරීමට එඩ්ගා ඩේල්ගේ අත්දැකීම් කේතුව (corn of experience) යොදා ගත හැකි ආකාරය උදාහරණ පහක් (05) මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

10. නූතන ගුරුවරයා නිතරම ශිෂ්‍යයාට ඉගෙනීම සඳහා සුසාධ්‍යකරුවකු ලෙස ක්‍රියා කරයි.

(i) සුසාධ්‍යකරණය යනු කුමක්දැයි හඳුන්වා නූතන ගුරු භූමිකාවේ දැකිය හැකි ලක්ෂණ හතරක් (04) විස්තර කරන්න. (ලකුණු 10)

(ii) සුසාධ්‍යකරණය නූතන ගුරු භූමිකාව තුළ සංවර්ධනය කරගත යුතු වැදගත් කුසලතාවයක් වේ. කරුණු තුනක් (03) ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 10)

11. **(i)** ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී ප්‍රධාන වශයෙන් යොදා ගන්නා ඉගැන්වීමේ ක්‍රම පහක් **(05)** නම් කරන්න. (ලකුණු 05)

**(ii)** ඉහත කී ක්‍රම අතරින් දෙකක් තෝරාගෙන නාට්‍ය හා රංගකලා ගුරුවරයෙකු වශයෙන් ඔබ ඒවා භාවිත කරන ආකාර වෙන වෙනම පෙන්වා දෙන්න. (ලකුණු 10)

**(iii)** එහිලා මතුවිය හැකි ප්‍රබලතා සහ දුබලතා නම් කරන්න. (ලකුණු 05)

12. භූමිකා නිරූපණය නාට්‍ය හා රංගකලා විෂය තුළ ප්‍රබලව යොදාගත හැකි ඉගැන්වීමේ ශිල්පීය ක්‍රමයකි.

**(i)** භූමිකා නිරූපණය යනු කුමක්දැයි මාන **(Dimensions)** තුනක් (03) ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 10)

**(ii)** නාට්‍ය හා රංගකලා ගුරුවරයෙක් ලෙස ද්විතීයික ශ්‍රේණි සඳහා පාඩම් පහක් **(05)** ඉගැන්වීමේ දී

**(A)** ඔබට යොදාගත හැකි භූමිකා නිරූපණ අවස්ථා පහක් **(05)** දක්වන්න. (ලකුණු 05)

**(B)** ඉහත දැක්වූ අවස්ථා පාඩම සංවර්ධනයට වැදගත් වූ ආකාරය කරුණු තුනක් **(03)** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

13. ද්විතීයික මට්ටමේ (6-10) ශ්‍රේණිවලින් එක් ශ්‍රේණියක් සඳහා නාට්‍ය හා රංගකලා විෂයේ භූමිකා රංගනය හෝ අංග රචනය හෝ රංග අභ්‍යාස පිළිබඳ පාඩමක් තෝරා ගන්න.

**(i)** ඔබ තෝරාගත් පාඩම ඇසුරින් සිසුන් අත්කර ගැනීමට අපේක්ෂිත නිපුණතා මට්ටම් සඳහන් කරන්න. (ලකුණු 05)

**(ii)** එහි එක් නිපුණතා මට්ටමකට අදාළ චර්යාමය අරමුණු පහක් **(05)** දක්වන්න. (ලකුණු 05)

**(iii)** ඉහත නිපුණතා මට්ටම් සාක්ෂාත් කරගැනීම සඳහා යෝග්‍ය පාඩම් සැලසුමක් සංවර්ධනය කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.